697

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
08 NOV 2011
UNIVERSITY OF KELANIYA

# විශ්වයේ සමාරම්භය පිළිබඳව බෞද්ධ හා උපනිෂද් මත; තුලනාත්මක අධ්‍යයනයක්

# (A Comparative study of the genesis of the Universe as depicted in the Upanishad & Buddhist scriptures)

දර්ශනපති පර්යේෂණ නිබන්ධය

නම : ඇත්කඳුරේ සුමනසාර හිමි
ශිෂ්‍ය අංකය : මාශාපී/**FGS/04/02/07/2007/01**

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 697 |
| වර්ග අංකය | |

සංස්කෘත අධ්‍යයන අංශය
මානව ශාස්ත්‍රපීඨය
කැලණිය විශ්වවිද්‍යාලය

2010 ජූනි

# සංක්ෂේපනය

භාරතීය දර්ශනයන් අතර උපනිෂද් සහ බෞද්ධ දර්ශනද්වය අතිශයින් සම්භාවිත වූවකි. වෛදික දර්ශනයෙහි හරය උපනිෂද් දර්ශනයෙහි විද්‍යමානව පවතී. උපනිෂද් දර්ශනය මුළුමහත් භාරතීය දර්ශනය ම හැඩගැස්වීමෙහි ලා කළ මෙහෙය සුළුපටු නොවේ. වේද ග්‍රන්ථයන්හි ආගමික චරණයන් ද, බ්‍රාහ්මණයන්හි තර්ක ද, ආරණ්‍යකයන්හි දේවධර්මය ද දක්වෙන අතර ඒ සියලු දාර්ශනික චින්තාවන් සංස්කරණාත්මකව වැඩි දියුණු වූ අයුරු උපනිෂද් ග්‍රන්ථයන්හි පිළිබිඹු වන බව කියැ වේ (රාධක්‍රිෂ්ණන්, 1970: 100). එසේ ම ස්වභාවවාදයේ (Naturalism) පටන් විශ්වයෙහි (Universe) අදෘශ්‍යමාන ස්වරූපය, පරම සත්තාව ආදී සංකල්පයන් වටහා ගැනීමෙහි ලා මිනිසා විසින් අන්තරාවලෝකනයෙන් කරන ලද නිරීක්ෂණයන්ගේ අනල්ප ප්‍රයත්නයන් උපනිෂද් කෘතී අධ්‍යයනය කිරීමෙන් වටහාගත හැකි ය. උපනිෂදයන්හි අභිමතාර්ථය වී ඇත්තේ කනස්සල්ලෙන් සිටි මනුෂ්‍යාත්මයට ශාන්තිය හා මෝක්ෂය සමීපකරවීම යි. තව ද භාරතීය බොහෝ දර්ශනයන්ගේ මූල බීජ උපනිෂද් කෘතීන්හි අන්තර්ග්‍රහණය වී ඇති ආකාරය ද පෙනේ.

විශ්වය පිළිබඳ අභිසංස්කෘත සිද්ධාන්තයන් ගොඩනැංවීමේ දී ආදිතම උත්සාහයක් උපනිෂදයන්හි විද්‍යමාන වෙතැයි කියැවෙන මහාචාර්ය මැනෙක්සිගේ (Maneksi) ප්‍රකාශය ද වැදගත් වූවකි. ඒ අනුව මෙම ඉගැනිවීම් මගින් දරන ලද ප්‍රයත්නය කවරාකාරද යි ගම්‍යමාන වේ. ශංකර විසින් සිය භාෂ්‍යයන් මගින් අතිසූක්ෂ්ම වූ අද්වෛත අධ්‍යාත්මවාදයක් (Spiritual Monism) උපනිෂදයන්හි පෙන්වා දෙන බව කියැ වේ (රාධක්‍රිෂ්ණන්, 1970: 101). කවරාකාරයෙන් විමර්ශනය කළ ද උපනිෂද් දර්ශනය මානව දර්ශන ඉතිහාසයෙහි සදානුස්මරණීය සන්ධිස්ථානයක් නියෝජනය කරන බව අවිවාදිත ය. උපනිෂද් දර්ශයෙහි ස්වභාවය වටහා ගැනීමෙහි ලා පහත සඳහන් නිර්වචනයන් ද වැදගත් වේ.

**"උපනිෂද් ග්‍රන්ථ සාමාන්‍යයෙන් බ්‍රාහ්මණ ග්‍රන්ථවල කොටස් වුව ද ඒවායෙහි සැබවින් ම යාගාදී පිළිවෙත් හා කර්ම මාර්ගාදී පක්ෂයට විරුද්ධව උගන්වන අලුත් ආගම් ධර්මයක් දිස් වේ"** (Macdonal, 1962: 215).

**''බමුණන් නිසරු යාග විද්‍යාවෙහි නියැලී සිටිය දී සෙස්සෝ උසස්තම ප්‍රශ්න නිරාකරණය කිරීමෙහි ලා යෙදී සිටිය හ. අන්තිමේ දී ඒ ගැටළු උපනිෂද් ග්‍රන්ථවල ප්‍රශංසාත්මකව සඳහන් විය''** (Hiriyanna, 1907: 237).

**''වේදයන්හි සඳහන් සියලු ම පිළිවෙත් ක්‍රම හා යාග ක්‍රම උපනිෂද් කෘතිවල නොසලකා හැරියා පමණක් නොව ඍජු ලෙස ම නිෂ්ඵල මිථ්‍යාවක් සේ නිෂ්ප්‍රභා කර ඇත''** (Max Muller: 1965: 16).

**''ආත්ම නැමති ධර්මය උපනිෂද්වල එන ප්‍රධාන ඉගැන්වීම ය. එය මූලික වශයෙන් දෙවියන් පිළිබඳ වෛදික සිරිතට ද සංස්කාර පිළිබඳ බ්‍රාහ්මණ ක්‍රමයට ද විරුද්ධ ය''** (Doyson: 1960: 21).

**''උපනිෂද් වූකලි හින්දූන් විසින් ක්‍රමික දර්ශනයක් සකස් කිරීමෙහි ලා ගන්නා ලද ප්‍රථම වෑයමෙහි වාර්තාගත තොරතුරු ය''** (Hume: 1971: 16).

යථෝක්ත නිර්වචනයන්ගෙන් ප්‍රකට වනුයේ ප්‍රාග් උපනිෂද්හි විද්‍යමානව පැවති කර්ම මාර්ගය බැහැර කරමින් ඥානමාර්ගයට ප්‍රධානත්වය ලබා දෙමින් විශ්වය හා ලෝකය පිළිබඳ විවෘත මනසකින් විමර්ශනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස උපනිෂද් දර්ශනය ප්‍රභවය වූ බව යි. සමස්තයක් ලෙස උපනිෂද් ග්‍රන්ථයන්හි සාකච්ඡා වන ප්‍රධාන කරුණු පහත පරිදි වේ.

1. ආත්මන් හා බ්‍රහ්මන් පදාර්ථය – (The Soul & the Highest Being)
2. පුනර්ජන්මය – (Palingenesis)
3. කර්ම දර්ශනය – (Philosophy of Kamma)
4. විද්‍යා හා අවිද්‍යා – (Knowledge & Dark)
5. විශ්ව නිර්මාණය – (Creation of the Universe)
6. ආචාර විද්‍යාව – (Ethiology)
7. මෝක්ෂ මාර්ගය – (Path of the Emancipation)

උපනිෂද් දර්ශනයේ අග්‍ර ඵලප්‍රාප්තිය බෞද්ධ දර්ශනය ලෙස පැවසීම සාවද්‍ය ම නොවේ. එහෙත් මෙකී දර්ශන ද්වයන්හි සාදෘශ්‍යතා මෙන් ම විසදෘශ්‍යතාවන් (Dissimilaraties) ද පවතී. ඇතැම් විද්වතුන්ගේ අදහසට අනුව බෞද්ධ දර්ශනයේ ජීවනාලිය වන්නේ උපනිෂද් දර්ශනයේ සාරය යි.

''ආදිකාලීන වත් පිළිවෙත් ක්‍රමය කෙරෙහි පිළිකුල බුදු දහමට මෙන් ම උපනිෂදයන්ට ද වූවකි. කර්ම නියාමයත් නිර්වාණය අවබෝධ කොට ගැනීමේ හැකියාවත් පිළිබඳ විශ්වාසය බුදු දහමෙහි මෙන් ම භාරතය පුරා දුනගෙන පැවතුණ දෙයකි. දුක ලෞකික දෙයෙහි දක්නට ලැබෙන ප්‍රධාන සත්‍යය බව උපනිෂදයන්හි ඇතුළු සෑම භාරතීය චින්තන ක්‍රමයක් විසින් ම පිළිගනු ලැබේ. උපනිෂද්වල හා අන්‍යාගමිකයන්ගේ ද සහයෝගය සහ කරුණාව බුදුන් වහන්සේට ලැබුණේ යැ යි උන්වහන්සේට හැඟී ගියේ ය. උන්වහන්සේ බ්‍රාහ්මණයින්ව බෞද්ධ භික්ෂූන් වහන්සේලා ගණයෙහි ලා සැලකූ අතර රහතන් වහන්සේ හා තාපසයින් හැඳින්වීම සඳහා ''බ්‍රාහ්මණ'' නම යෙදූ සේක. අව ම වශයෙන් ආරම්භය අතින් හෝ බුදු දහම හින්දු ධර්මයෙන් පැනනැගුණකි. බුදු දහම හැදුණේ සහ වැඩුණේ ද වෛදික විශ්වාස නැමති පරිසරය තුළ ය'' (Rhys Davis, 1960: 85).

යථෝක්ත ප්‍රකාශය විමසීමේ දී පැහැදිලි වන්නේ එහි දැක්වෙන සියල්ල යථාර්ථයක් නොවන බව යි. බ්‍රාහ්මණ නමින් තම ශ්‍රාවකයින් හැඳින්වූව ද බුදු දහමෙහි දී බ්‍රාහ්මණ යන්නට වෙනම ම අර්ථකථනයක් ඇත. **''බාහිත පාපධම්මෝ බ්‍රාහ්මණෝ''** එනම් සපුරා පව් බැහැර කළ තැනැත්තා බ්‍රාහ්මණ නමින් පෙන්වා ඇත. එසේ ම සමුච්ඡේද ප්‍රහාණයෙන් සියලු ක්ලේශයන් ප්‍රහීණ කළ අතිශයින් ශාන්තභාවයට පැමිණි රහතන් වහන්සේ කිසිකලෙකත් අන්‍යාගමික තාපසයන් හා සමාන නොවෙති.

ආවසානික පරමනිෂ්ඨාව (Final Gold) සම්බන්ධයෙන් යම්තාක් දුරට උපනිෂද් දාර්ශනිකයා ද බුදු දහමට සමීපව ගමන් කර ඇත. ජීවිත පැවැත්ම සකස් කරන ලද උපනිෂද් මුනිවරයාගේ අවසාන පැතුම වූයේ විමුක්ති සුවය යි. ඔව්හු ''කිං සච්ච ගවේසී'' ලෙසින් විසුවේ ද විමුක්තිය ලැබීමට ය. එකී විමුක්තිය වූකලි නව්‍ය වූ දෙයක් නොව ආත්මන් හෝ බ්‍රහ්මන් පදාර්ථයෙහි සහභාව්‍යතාව ලැබීම විය. ඒ සම්බන්ධයෙන් පහත ප්‍රකාශය වැදගත් වූවකි.

**"ධනුර්ගෘහීත්වා ඖපනිෂදං මහාශාස්ත්‍රම්**
**ශරං හි උපාසානිශීතං සංදධීතා**
**ආයම්‍ය තද්භාවගතේන චේතසා**
**ලක්‍ෂ්‍යං තද්වෝක්ෂරං සෞම්‍ය විද්ධි"** (මු. උප. 2. 2. 3).

උපනිෂද් ඉගැන්වීම් නැමති දුන්න ගෙන එහි භාවනාව නැමති ඊය යොදා, සිත නැමති දියෙන් ඇද බ්‍රහ්ම පදාර්ථය නැමති ඉලක්කයට විදීමෙන් විමුක්ති සුවය (Comfort of emancipation) ලබාගත හැකි ය යන්න එයින් ප්‍රකාශ වේ.

මෙහි දී අවසාන ඉලක්කය බ්‍රහ්මන් සහව්‍යතාව කෙසේ වෙතත් චිත්ත පාරිශුද්ධතාවෙන් විමුක්තිය සාධනය කළ හැකි බව දර්ශන ද්වයයේ ම පිළිගැනේ. මෙසේ උපනිෂද් ඉගැන්වීම් භාරතය පුරා රැව් පිළි රැව් දෙද් දී, එසේ ම උපනිෂද් මුනිවරුන් කරා දහස් සංඛ්‍යාත පිරිස් ඇදී යද්දී, රාජ සභාවල පවා උපනිෂද් චින්තාවන් සාකච්ඡා කෙරෙද් දී, එයින් තෘප්තියට පත් නොවූවෝ නව්‍ය වූ වෙනත් යමක් සෙවීමෙහි නිරතවන්නට වූහ. මෙහි ප්‍රතිඵලය වූයේ ඔවුන් අතුරින් ම නව දාර්ශනිකයෙකුගේ පහළ වීම යි. ඒ අන් කෙනෙකු නොව ගෞතම බුදුන් වහන්සේ ය. එවක පැවති උපනිෂද් මුනිවරුන්ගේ සියලු ඉගැන්වීම් මැනවින් බුදුන් වහන්සේ විසින් පරිශීලනය කරන ලද බවට බෞද්ධ දර්ශනයෙහි ම සාධක පවතියි.

භාරතීය දර්ශනය එක ම ප්‍රවාහයකි. එය නොසිඳෙන නදියක් සේ නොනැවතී ගලා ගියේ ය. මහා සාගරයට වැටෙන තැන ජලය ගැඹුරු ය. පිරිපුන් ය. එමෙන් ම උපනිෂද් දර්ශනය නදියේ නොගැඹුරු බොරදිය සහිත පටන්ගත් ස්ථානය වැනි ය. බෞද්ධ දර්ශනය වූකලි විප්පසන්න අනාවිල ගම්භීර ස්ථානය වැනි ය. උපනිෂද් හා බෞද්ධ දර්ශනයන්හි පෙනෙන ඇතැම් සාම්‍යතාවන් සැලකිල්ලට ගෙන **"බුදුන් වහන්සේ හින්දු කාරයෙකු ලෙසින් ඉපදී හින්දු කාරයෙකු ලෙස මිය ගිය හ"** යනුවෙන් හැඟීන්වීමට පවා ඇතැම් බටහිර උගත්හු පෙළඹී ඇත.

"Gothama was born and brought up and lived and died as Hindu…………..."
(Rhys Davids, 1922: 83).

සර්වපල්ලි රාධක්‍රිෂ්ණන් වැනි භාරතීය විචාරකයෝ පවා බුදුන් වහන්සේ අලුත් දෙයක් ඇති කළ උතුමෙකු ලෙස නොසලකා උපනිෂද් ඉගැන්වීම් ම ප්‍රකාශ කළ භවතෙකු යැයි ප්‍රකාශ කරති (රාධක්‍රිෂ්ණන්, 1929: 470). උපනිෂද් දර්ශනය හා බුදු දහම අතර යම් යම් සමානකම් පැවතුණ ද ඉහතින් දැක් වූ ප්‍රකාශයන් සමග අපට කිසිසේත් එකඟවිය නොහැක. උපනිෂද් දර්ශනයෙහි ඉගැන්වෙන කර්ම දර්ශනාදී සියලු දාර්ශනික තේමාවන් බෞද්ධ දර්ශනය හා සාධාරණ වන්නේ සම්පූර්ණයෙන් ම නොවේ. මේ දර්ශනද්වය අතර තරමක සාම්‍යතාවන් පැවතුණ ද බුදු දහම අනාත්මවාදී වීම නිසා ම විශාල පරතරයක් පෙනේ. මෙහි කියැවෙන අනාත්ම දර්ශනය උපනිෂද් මුනිවරුන්ගේ පා සටහන් මතින් බිහිවූවක් නොව එය උපනිෂද් චින්තාවන්ගේ සාවද්‍ය තැන් බැහැර කොට විශ්වයේ නිස්සාරභාවය හා ශූන්‍යත්වය (Emptiness) අවබෝධයෙන් වෙනත් මගකින් තැබූ පියවරකි. මේ අනුව බුදුන් වහන්සේ උපනිෂද් මුනිවරුන් විසින් ආත්මවාදය නැමති කෘෂ්ණ පටලයෙන් වසා තිබුණු මිනිසා ඉන් එළියට ගැනීම වස් අනාත්ම දර්ශනයක් (Philosophy of Non-Soul) ලොවට හෙළි කර ඇති බව කිව යුතු ය.

බුදු රජාණන් වහන්සේ විසින් ''**සබ්බං අනිච්චං යදනිච්චං තං දුක්ඛං යං දුක්ඛං තදනත්තං**'' යනුවෙන් පෙන්වා දෙමින් ආත්මවාදය බැහැර කළ හ. දීඝ නිකායේ බ්‍රහ්මජාල සූත්‍රයට අනුව බුදුන් වහන්සේ විසින් ඛණ්ඩනය කරන ලද ආත්මවාදයේ ප්‍රභේද රාශියකි.

1. ශාස්වතවාද දෘෂ්ටිය
2. ඒකත්‍ය ශාශ්වතවාද දෘෂ්ටිය
3. අත්තානත්තික දෘෂ්ටිය
4. අමරාවික්ෂේපිත දෘෂ්ටිය
5. අධිත්‍ය සමුප්පන්න දෘෂ්ටිය
6. ෂෝඩසවිධ සංඥා දෘෂ්ටිය
7. අෂ්ටවිධ අසංඥා දෘෂ්ටිය
8. අෂ්ටවිධනෙව සංඥා දෘෂ්ටිය
9. දෘෂ්ටධර්ම නිර්වාණ දෘෂ්ටිය වශයෙනි.

තව ද ජාලිය සූත්‍රයට අනුව උපනිෂදයන්හි කියැවෙන ආත්මවාදය ප්‍රතික්ෂේප කරමින් බුදු හිමියන් මෙසේ කරුණු පැහැදිලි කරති.

**"අහං බෝ පනේතං ආවුසෝ ඒවං ජානාමි. ඒවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරංන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්තිවාති"** (දී. නි, 1976: 348).

ඇවැත්නි, මම වනාහි මෙය මෙසේ දනිමි. මෙසේ දකිමි. එසේ වුවත් එය ම ශරීරය යැ යි හෝ එය ම ජීවය යැ යි හෝ ජීවය අනෙකකි. ශරීරය අනෙකෙකැ යි හෝ යන මෙය මම නොකියමි යනු උක්ත උද්ධෘතයෙහි අදහස යි. මේ අනුව බුදුන් වහන්සේ ආත්මවාදය නොපිළිගන්නා බව පැහැදිලිව පෙනේ.

යථෝක්ත දර්ශනයන්හි පරම වූ මෝක්ෂය සම්බන්ධයෙන් කෙරෙන ඇතැම් ප්‍රකාශයන් සමානාකාරයෙන් පෙනේ. මේ දර්ශන ද්වයෙහි ම කියැවෙන විමුක්තිය අවබෝධ කර ගත යුත්තක් මිස ලබා ගත හැකි දෙයක් නොවේ. ඒ සම්බන්ධයෙන් මෙසේ දක්වා ඇත.

**"න තත්‍ර සූර්යෝ භාති න චන්ද්‍ර තාරකං**
**නේ මා විද්‍යුතෝ භාන්ති කුතෝ'යං අග්නිඃ**
**තමේව භාන්තං අනුභාති සර්වං**
**තස්‍ය භාසා සර්වමිදං විභාති"** (මු. උප. 2. 4. 3).

එහි සූර්යයා නොපායයි. චන්ද්‍ර තාරකා ද නැත. විදුලි එළිය ද නොවේ. එසේ නම් අග්නිය එහි කොහිත් ද? සියලු ම බැබළීම් මෙය පසුබායි. ඔහුගේ රශ්මීහු මේ සියල්ල බබළව යි යනු එහි අදහස යි. මෙහි දී බ්‍රහ්ම සහව්‍යතාව ලැබීමෙන් පූර්ණ මෝක්ෂගාමී වූ පුද්ගලයා අපරිමිත විශ්වාලෝකයක් කරා සමීප වන බව ගම්‍යමාන කෙරේ.

බෞද්ධ නිර්වාණය සම්බන්ධයෙන් උදාන පාලියේ කියැවෙන පහත ප්‍රකාශය විමසා බලමු.

**"යත්ථ ආපෝච පඨවි තේජෝ වායෝ න ගාධති**
**න තත්ථ සුක්කා ජෝතන්ති ආදිච්චෝ නප්පකාසති**
**න තත්ථ චන්දිමා භාති තමෝ තත්ථ න විජ්ජති"** (උ. පා, 1960: 66).

යම් නිර්වාණ ධාතුවක ආපෝ ධාතුව ද, පෘථිවි ධාතුව ද, තෙජෝ ධාතුව ද, වායෝ ධාතුව ද නොපිහිටා ද, එහි තාරකාවෝ නොබබළති. සූර්යයා නොබබළයි. එහි චන්ද්‍රයා නොබබළයි. එහි අන්ධකාරය ද නැත.

දර්ශන ද්වයෙහි විමුක්තිය සම්බන්ධයෙන් මෙහි කියැවෙන අදහස්වල පැහැදිලි සමීපතාවක් මෙමගින් ප්‍රඥායමාන වේ. එසේ ම නිශේධවාදී (Negative) පද රාශියක් ද හඳුනාගත හැකි ය. තව ද උපනිෂද් දර්ශනයේ මෙන් ම බෞද්ධ දර්ශනයෙහි ද විමුක්තිය ලැබීමෙහි ලා පින් පව් දෙක ම නැසීම කළ යුතු බව පෙන්වා දී ඇත.

**"යදා පශ්‍යඃ පශ්‍යතේ රුක්ම වර්ණං**
**කර්තාරං ඊශං පුරුෂං බ්‍රහ්ම යෝනිං**
**තදු විද්වාන් පුණ්‍ය පාපේ විධූය**
**නිරඤ්ජනඃ පරමං සාමමුපෙති"** (මු. උප. 3. 2).

යම් විටෙක ඍෂි තෙමේ රන් පැහැ වූ, කර්තෘ වූ, ඊශ්වර වූ, පුරුෂ වූ බ්‍රහ්ම යෝනිය දකිත් ද, එවිට ඒ මේධාවි තෙමේ පින් පව් නසා ඇලීමෙන් තොර වූයේ ඊශ්වර සමග පරම තත්ත්වයට පැමිණෙන්නේ ය යනු එයින් කියැවෙන අදහස යි.

**"යන්නූනාහං ඉමං කුල්ලං ථලේ වා උස්සාදෙත්වා උදකේ වා ඕපිලාපෙත්වා යේන කාමං පක්කමෙය්‍යන්ති. ඒවං කාරී ඛෝ සෝ භික්කවේ පුරිසෝ තස්මිං කුල්ලේ කිච්චකාරී අස්ස. ඒවමේව ඛෝ භික්ඛවේ කුල්ලූපමෝ මයා ධම්මෝ දේසිතෝ. නිත්ථරණත්ථාය නෝ ගහණත්ථාය. කුල්ලූපමං වෝ භික්ඛවේ ධම්මං දේසිතං ආජානන්තේහි ධම්මාපි වෝ පහාතබ්බෝ පගේව අධම්මා"** ( ම. නි, 1964: 324).

උක්ත උද්ධෘතයෙන් ද ප්‍රකාශ වන්නේ පින් පව් දෙක ම නසා සංසාරයෙන් එගොඩ විය යුතු බව යි. ගඟෙන් එගොඩ වූ තැනැත්තේ පාරුව ගඟෙහි පා කර දමා යයි. ඊට හේතුව පාරුව ඔහුට තවදුරටත් අවශ්‍ය නොවන හෙයිනි. එමෙන් ම නිර්වාණගාමී වන තැනැත්තාට රැස් කළ කුශල කර්ම ද අනවශ්‍ය ය. එහෙයින් පව් පමණක් නොව පින් ද ප්‍රහීණ කළ යුතු වේ. මේ අනුව උක්ත ප්‍රකාශනයන් දෙකෙහි ම සාම්‍යතා හඳුනාගත හැකි ය.

මෙසේ කරුණු විමසා බලමින් උපනිෂද් දර්ශනය හා බෞද්ධ දර්ශනය උපමාවකින් පවසන්නේ නම් උපනිෂද් දර්ශනය වනාහි සඳ නැති තරු පිරිවරාගත් නබෝ ගැබ වැනි ය. බෞද්ධ දර්ශනය වූකලි තරු පිරිවරාගත් සඳින් දසත විහිදුවන සොම්රැස්වලින් ලලිත වූ මනස්කාන්ත අහස්තලය වැනි ය.

යථෝක්ත උපනිෂද් සහ බෞද්ධ යන දර්ශනයන් ප්‍රධාන විෂය ක්‍ෂේත්‍රය කරගනිමින් කෙරෙන මෙම නිබන්ධයෙන් විමර්ශනය කෙරෙනුයේ විශ්වයේ සමාරම්භය පිළිබඳ උපනිෂද් සහ බෞද්ධ මතවාදයන් ය. එහි දී පර්යේෂණ ගැටළුව වශයෙන් අභිප්‍රේත වූයේ බෞද්ධ දර්ශනාගත විශ්ව සම්භව මතය උපනිෂද් දර්ශනයෙහි ම දිගුවක් ද? යන්න යි.

අචින්තෙය්‍ය (Thoughtless) ධර්මයක් ලෙස බුදුරදුන් විසින් පෙන්වා දුන් විශ්වයේ සමාරම්භය පිළිබඳ යථෝක්ත ගැටළුව විමර්ශනය කිරීම වස් මෙම පර්යේෂණ නිබන්ධය සැකසීමේ දී පරිච්ඡේද පහකින් පරිමිත වන සේ කරුණු ගොනු කරන ලදි. ආරම්භයේ සිට උපනිෂද් දක්වා භාරතීය දර්ශනයේ ප්‍රභවය සහ විකාශය පිළිබඳ විමර්නයෙහි දී වේද යුගයෙහි ඇදහිලි හා විශ්වාස, දේවවාදය, භාරතීය දාර්ශනික යුග හා භාරතීය දර්ශනයේ ස්වභාවය යන ක්‍ෂේත්‍රයන් සාකච්ඡා කරන්නට යෙදුණේ උපනිෂද් හා බෞද්ධ දර්ශනයන් දක්වා යුගානුරූපී ක්‍රමික දාර්ශනික පරිසරය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට ය. ග්‍රීක දර්ශනයෙහි ඇදහිලි හා විශ්වාස පිළිබඳ කරුණු ගෙනහැර දක් වූයේ පෙරදිග මෙන් ම අපර දිග දර්ශනය ද ප්‍රභවය වූයේ සමාන චින්තාවන්ගේ ස්වරූපයෙන් බව පෙන්වා දීමට ය.

දෙවන පරිච්ඡේදය වෙන් වූයේ විශ්වය සහ එහි ප්‍රභවය පිළිබඳ උපනිෂද් දර්ශනානුගත ඉගැන්වීම් අධ්‍යයනය කිරීමට ය. එහි දී ආරම්භයේ සිට ම විශ්වය සහ එහි සමාරම්භය පිළිබඳ ඉගැන්වීම් වේද, බ්‍රාහ්මණ, ආරණ්‍යකාදී පිළිවෙළින් සියලු ප්‍රාග් උපනිෂද් මතවාදයන් ප්‍රථමයෙන් විමර්ශනය කළෙමි. තදනන්තරව ප්‍රධාන උපනිෂද් ග්‍රන්ථ, ඒවායේ ඉගැන්වෙන විශ්ව සම්භව මතවාද, උපනිෂද් දර්ශනයේ ප්‍රධාන ධර්ම සිද්ධාන්ත සහ සූක්ෂ්ම බ්‍රහ්මන්ගේ විශ්ව නිර්මාණයේ සාධාරණීකෘත බව ද විමර්ශනය කරන්නට යෙදිණ. මෙහි උපනිෂද් හා ප්‍රාග් උපනිෂද් උද්ධෘත දැක්වීමේ දී රෝම ඉලක්කම් භාවිතයෙන් වැළකී හින්දු අරාබි ඉලක්කම් භාවිත කළේ පරිගණක තාක්‍ෂණික දෝෂ මගහැරීමට ය. තුලනාත්මක

අධ්‍යයනයක් (Comparative study) ලෙසින් සිදු කළ මෙම පර්යේෂණ නිබන්ධයෙහි තෙවන පරිච්ඡේදය වෙන් වූයේ බුදු සමයාගත විශ්ව සම්භව මතය අධ්‍යයනය සඳහා ය. එහි දී විශ්වය පිළිබඳ බෞද්ධ විග්‍රහය ත්‍රිපිටකයේ හඳුනාගත් සූත්‍ර 50 පමණ ආශ්‍රයෙන් විමර්ශනය කළ අතර ජීවයේ සම්භවය, ජීවලෝක සහ විශ්වයේ විනාශය පිළිබඳව ද අවධානයක් යොමු කළෙමි. බුදුන් වහන්සේ විසින් අන්‍යාගමික දාර්ශනික විශ්ලේෂණයන්ට (Annlysis of philosophy) වඩා යථානුරූපීව විශ්වය හා ලෝකය පිළිබඳ විග්‍රහ කරන්නට යෙදුණේ උන්වහන්ගේ අසිරිමත් බුදු නුවණ නිසා ය. එබැවින් විශ්වය හඳුනා ගැනීමෙහි ලා පාදක වූ බුදු නුවණ පිළිබඳ ත්‍රිපිටකය මෙන් ම අටුවාගත කරුණු ද පරීක්ෂා කරමින් විශේෂ අවධානයක් යොමු කිරීම ප්‍රස්තාවෝචිත විය.

සිව්වැනි පරිච්ඡේදයෙහි දී සාකච්ඡා කෙරෙනුයේ විශ්වයේ සමාරම්භය පිළිබඳ අන්‍යාගමික, දාර්ශනික හා විද්‍යාත්මක මතවාදයන් ය. එහි දී විශේෂයෙන් ලෝක ආගම් දර්ශනයන්හි ප්‍රභවය, ඒ පිළිබඳ විද්වත් මතවාද ආශ්‍රයෙන් සාකච්ඡා කෙරෙන අතර ලෝක ආගම්හි ඒකදේවවාදය, බහුදේවවාදය, ඒකබහුදේවවාද යන සියලු අංශයන් ආවරණය වන පරිදි ආගම් රාශියක් ආශ්‍රයෙන් විශ්ව නිර්මාණය පිළිබඳ විමර්ශනය කරන ලදි. එහි ලා අදේවවාදී ආගමික අංශය ඇතුළත් නොවූයේ ප්‍රධාන පර්යේෂණ ක්ෂේත්‍රයක් ලෙස තෘතීය පරිච්ඡේදයෙහි දැක්වෙන හෙයිනි. මෙසේ අන්‍යාගමික, දාර්ශනික සහ විද්‍යාත්මක මාතවාද විමර්ශනයෙන් උපනිෂද් සහ බෞද්ධ විශ්වනිර්මාණ (Buddhist Cosmology) මතවාදයන් කවරාකාරයෙන් යථාර්ථයට සමීප වන්නේදැ යි අවබෝධ කර ගැනීමට අවකාශ ලැබිණි.

උක්ත විෂය ක්ෂේත්‍රය පිළිබඳ පූර්ව පරිච්ඡේදයන්හි කී කරුණු සමාලෝචනයෙන් සහ උපනිෂද් හා බෞද්ධ මාතවාදයන් තුලනාත්මකව විමර්ශනයෙන් ප්‍රස්තුත පර්යේෂණ ගැටළුවට අදාළව ප්‍රාමාණික නිගමනයකට එළඹෙන ලදි.